
# City NEWS

MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නිල ඊ පුවත් පත

කලාපය 05

2023 මාර්තු 01


## ගම්පහ, මහර, කටාන, වත්තල හා ජා ඇලට

# නව සංවර්ධන සැලසුම්

ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගර කිහිපයක් සංවර්ධනය කිරීමට තීරණය කෙරේ. ගම්පහ, මහර, කටාන, වත්තල සහ ජාඇල එම නගරවේ. නාගරික සංවර්ධන අධිකාරිය ඊට අදාළ නගර සංවර්ධන සැලැසුම් කෙටුම්පත් සකස් කර තිබේ. ඒ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදියි.

පිටුව 02





පිටුව 07

## බැද්දගාන

# තෙත් බිම් උද්‍යානයට QR කේතයක්







පිටුව 05

## 75 වන නිදහස් සැමරුම වෙනුවෙන් රට පුරා

# රුක් රෝපණ වැඩසටහන්

පිටුව 05

සංසාරේ ඉහ ඉද්දර දිරි දෙන්නී
කටු අකුලේ මල් යහනක් සාදන්නී
ලේ කිරි වලින් ලෝකය බිහි කර ලන්නී
අඳුර දුරැර රන් පහනක් දල්වන්නී

## ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ

# ඉදිරි ආරක්ෂාව වෙනුවෙන්

# රුපියල් මිලියන 300 ක තැන්පතුවක්

පිටුව 04




## කොන්ත්‍රාත්කරුවන්ගේ ගැටලු විසඳීමට

# නව ක්‍රමවේදයක්

පිටුව 05

# කතු වැකිය

"අපි වවමු" යන්න දශක ගණනාවක් තිස්සේ ඇසෙන පාඨයකි.
බලයටපත් සෑම රජයක්ම වගාවෙන් රට ස්වයං පෝෂිත කිරීමට විවිධ ව්‍යාපෘති දියත් කළ බව අපිට මතකය.
නමුත් එය හුදු පාඨයකට පමණක් සීමා වුවකි. වගා කිරීම සම්බන්ධයෙන් අප රටේ කිසිදු ගැටළුවක් නැත.
නමුත් අස්වැන්න පාරිභෝගිකයාට යාමේ නිසි වැඩ පිළිවෙළක් නැත. ඒ සම්බන්ධයෙන් ගොවින්ට දැනුමක්ද නැත.
එබැවින් අපේ අස්වැන්නෙන් 25%කටත් වැඩිය නාස්ති වේ.
ඉදිරියේදී ඇති විය හැකි ආහාර අර්බුදය මැඩපවත්වා ගැනීම පිණිස වැඩි වශයෙන් වගාවට
නැඹුරු විය යුතුය.
වස විසෙන් තොර නිවෙසේ ඉවතලන කොළ රොඩු ආදි කාබනික පොහොර භාවිතයෙන්
තම පරිභෝජනයට
අවශ්‍ය තරමට වගාවන් සිදුකර ගැනීමේ හැකියාව අපි සියලුම දෙනාට තිබේ.
එබැවින් අඳුරට ශාප නොකර
එක් පහනක් හෝ දල්වාලන්නට උත්සුක වෙමු.
නැතහොත් සිදුවන්නේ තව දුරටත් අර්බුදයට බැණ වදිමින් උඩ බලාන සිටීම පමණි.

**උපදේශකත්වය**
ඇමතිතුමාගේ මාධ්‍ය ලේකම්
ප්‍රදීප් අනුර කුමාර
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

**සංස්කරණය**
අමිල දර්ශන හේරත්

**පිටු සැකසුම**
ධනුෂිකා කුමාරි

**විශේෂාංග ලිපි**
හාලක දහනායක
නිහාර චාමික පෙරේරා
අමිල දර්ශන හේරත්
මුනීරා අබු බක්කර්

**සෝදුපත් බැලීම**
පී.බී.එස්. සම්පත්

**සම්බන්ධීකරණය**
දිලිනි කොඩෙලපා
නදුන් තාරක
තිලංක නිරෝෂන්

**ඡායාරූප**
නුවන් දිනේන්ද්‍ර
නලින් හේවාපතිරණ

**පරිගණක සහය**
සචිදු සංකල්ප
තිළිණ නිර්මාල්

මාධ්‍ය ඒකකය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහල
සෙත්සිරිපාය
බත්තරමුල්ල
94 11 286 7163
94 11 286 5479
paper.citynews@gmail.com

## ගම්පහ, මහර, කටාන, වත්තල හා ජා - ඇලට

# නව සංවර්ධන සැලසුම්

මේ වනවිට ගම්පහ නගරය තියනෑවේ හරිත අගනගරය ලෙසත්, මහර නගරය හරිත සහ සංස්කෘතික නගරයක් ලෙසත්, කටාන නගරය ගුවන් නගරයක් ලෙසත්, වත්තල නගරය බිත්තාසිර සශ්‍රීක හරිත නගරයක් ලෙසත්, ජා ඇල නගරය හරිතවත් ආයෝජන නගරයක් ලෙසත් සංවර්ධනය කෙරේ. 2023 සිට 2033 දක්වා වූ ඉදිරි දස වසර තුළ එය ක්‍රියාත්මකයි.

කෙටුම්පත් කරන ලද නගර සංවර්ධන සැලැසුම් සඳහා මහජන නියෝජිතයින්ගේ සහ නිලධාරීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට මේවන විට නාගරික සංවර්ධන අධිකාරිය පියවර ගෙන තිබේ. නගර සංවර්ධන සැලැසුම් කෙටුම්පත් අදාළ පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් සහ නගරාධිපතිවරුන් වෙත ද ලබා දී ඇත.

අදාළ පළාත් පාලන ආයතනවල අනෙකුත් මන්ත්‍රීවරුන් වෙතද මෙම කෙටුම්පත් ලබා දී ඔවුන්ගේ සහ මහජනතාවගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට කටයුතු කෙරේ. ඒ සඳහා දින 60 ක කාලයක් ලබා දී තිබේ. නාගරික සංවර්ධන අධිකාරිය විසින් එම නගර සංවර්ධන සැලැසුම් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ ඉන් අනතුරුවයි.

විෂය භාර අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන ඕනෑම ප්‍රදේශයක් සඳහා නගර සංවර්ධන සැලැස්මක් සකස් කර එය ක්‍රියාත්මක කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය බැඳී සිටී. ඒ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත මඟිනි.

ගම්පහ නගර සංවර්ධන සැලැස්මේ දැක්ම වන්නේ "තියනෑවේ පිහිටුන හරිත අගනගරය" යන්නයි. "කොළඹ හර ප්‍රදේශයේ හරිතවත් නාගරික උරුමය" යන්න මහර නගර සංවර්ධන සැලැස්මේ දැක්මයි. කටාන නගර සංවර්ධන සැලැස්මේ දැක්ම වන්නේ "ගෝලීය ගුවන් පුරය හා බැඳි සුවපහසු නාගරික පුරවරය" යන්නයි. "බිත්තාසිර කලාපයේ සශ්‍රීක හරිත













ජීවනාලය" යන්න වත්තල නගර සංවර්ධන සැලැස්මේ දැක්මයි. ජාඇල නගර සංවර්ධන සැලැස්මේ දැක්ම වන්නේ "හරිතවත් ආයෝජන පුරය" යන්නයි. ඉඩම් හා ගොඩනැඟිලි සංවර්ධනය, ආර්ථික හා සංචාරක සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, තිරසාර පරිසර සංවර්ධනය යන ප්‍රධාන උපාය මාර්ග මූලික කර ගනිමින් මෙම නගර සැලසුම් ක්‍රියාවට නැංවේ.

කොළඹ පරිපාලන අගනගරයට හා වාණිජ නගරවලට මෙන්ම කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ මෙම නගරවල සිට ඇති ආසන්න දුර, ජාතික හා කලාපීය මට්ටමින් ගමනා ගමන ව්‍යාපෘති හා ගමනා ගමන සේවා සඳහා වන බලපෑම, දැනට මෙම නගරවල පවතින හා අනාගතයේ ජනගහනයේ ඉල්ලුම පිළිබඳව අවධානය යොමු කොට මෙම නගර සංවර්ධන සැලැසුම් සකස් කර තිබේ. එමෙන්ම මෙම නගර ආශ්‍රිතව පවතින කෙත් බිම් හා ඒවා උපයෝගී කර ගනිමින් කෘෂි, අයෝජන, ආයුර්වේද, හරිත පරිසර පද්ධති ඇති කිරීමේ හැකියාව ද මෙම සංවර්ධන සැලැසුම් ක්‍රියාත්මක කිරීමේදී මූලිකත්වය ලබා දෙයි.

ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිහිටි එකම පුරාවිද්‍යා රක්ෂිතය වන පිළිකුත්තුව රක්ෂිතය, මෙරට වැඩිම ලෙන් සංඛ්‍යාවක් සහිත විහාරය වන පිළිකුත්තුව විහාරස්ථානය, අක්කර 000 ක භූමි ප්‍රමාණයක කඳු පන්ති පෙළකින් සමන්විත උතුම්කන්ද රක්ෂිතය, මාළිගාතැන්ද රජමහ විහාරස්ථානය, ශ්‍රී ලංකාවේ ප්‍රථම නිදහස් වෙළඳ කලාපය වන වන කටුනායක වෙළඳ කලාපය, මෙරට පළමු ජාත්‍යන්තර ගුවන් තොටුපළ වන කටුනායක ගුවන්තොටුපළ, නිර්මාණිය ශ්‍රී ලංකාවේ විශාල මෙගා කලපුව වන මීගමුව කලපුව, මෙරට විශාලතම නාගරික තෙත්බිම වන මුතුරාජවෙල අභය භූමිය, ධීවර කටයුතු සඳහා ජාතික ආර්ථිකයට දායකත්වය සපයන දිස්ත්‍රික්ක වරාය, කෙරවලපිටිය කර්මාන්ත කලාපය ඇතුළු පාරිසරික, ආයෝජන සහ ජාතික උරුමයන් සහිත ඓතිහාසික ස්ථාන රැසක් මෙම නගර ආශ්‍රිතව පිහිටා තිබේ.

නිහාර චාමික පෙරේරා

# ජගත් කාන්තා දිනයේ වතගොත...

ජාත්‍යන්තර කාන්තා දිනය සම්බන්ධයෙන් අපට බොහෝ දේ අසන්නට ලැබෙයි. ඒත් එය කුමක් සඳහා ද? කවදාට යෙදී තිබේ ද? එය සැමරීමක් ද? එසේ නැතහොත් විරෝධය පළ කිරීමක් ද? යන්න අපට ප්‍රශ්නාර්ථයකි.සියවසකට අධික කාලයක් පුරා ලෝකවාසී ජනතාව කාන්තාවන්ට සුවිශේෂී වූ දිනයක් ලෙස මාර්තු 08 වන දා සමරති. එනම් එම දිනය එක්සත් ජාතීන්ගේ පිළිගත් වාර්ෂික උත්සවයක් ලෙස ජාත්‍යන්තර කාන්තා දිනය දක්වා වර්ධනය වූයේ කම්කරු ව්‍යාපාරය හරහාය. 1908 වර්ෂය එහි මූලාරම්භයයි. ඒ, කාන්තාවන් 15,000ක් තමන් වැඩ කරන පැය ගණන කෙටි කරන ලෙසටත්, වඩා හොඳ වැටුප් දෙන ලෙසටත්, ඡන්ද අයිතිය දෙන ලෙසටත් ඉල්ලමින් නිව්යෝර්ක් නගරයේ පැවැත්වූ පාගමනක් හේතුවෙනි. ඉන් වසරකට පසු පළමු ජාතික කාන්තා දිනය ප්‍රකාශයට පත් කරන ලද්දේ ඇමෙරිකානු සමාජවාදී පක්ෂය විසිනි.

මෙම දිනය ජාත්‍යන්තර දිනයක් බවට පත් කළ යුතු යැයි අදහස් පළ කළේ ක්ලාරා සෙට්කින් නමැති කාන්තාවකි. ඇය මෙම අදහස යෝජනා කළේ, 1910දී කෝපන්හේගන්හි පැවති වැඩ කරන කාන්තාවන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේදීය. එම සමුළුවට රටවල් 17ක කාන්තාවන් 100 දෙනෙකු සහභාගි වූ අතර ඇයගේ එම යෝජනාව ඒකමතිකව ස්ථිර විය.

එය පළමු වරට 1911 වසරේදී ඔස්ට්‍රියාව, ඩෙන්මාර්ක්, ජර්මනිය සහ ස්විට්සර්ලන්තය යන රටවල සැමරිය. ජාත්‍යන්තර කාන්තා දිනයේ ශතක සැමරුම 2011 වසරේදී සැමරිණි. ඒ අනුව මේ වසරේදී සැමරෙන්නේ, 113 වන ජාත්‍යන්තර කාන්තා දිනයයි.


1975 වසරේදී එක්සත් ජාතීන්ගේ සංගමය විසින් එය සමරනු ලැබීමත් සමග ඊට නිල පිළිගැනීමක් ලැබිණි. එම දිනය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංගමය යෙදූ පළමු තේමා පාඨය වූයේ, "අතීතය සමරමින්, අනාගතය සැලසුම් කරමින් සිටිමු," යන්නය. මෙවර එහි තේමාව වී ඇත්තේ, " ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා නවෝත්පාදන සහ තාක්ෂණය" යන්නය. එමගින් ඉල්ලා සිටින්නේ, "ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු දරුවන් ශක්තිමත් කිරීම සඳහා නවෝත්පාදන සහ තාක්ෂණික වෙනස්කම් සහ ඩිජිටල් යුගයේ අධ්‍යාපනය"ලබා දෙන ලෙසයි. ජාත්‍යන්තර කාන්තා දිනය සමාජය, දේශපාලනය හා ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි කාන්තාවන් කොතරම් දුරට පැමිණ ඇත්දැයි සැමරීමේ දිනයක් බවට පත්ව ඇති අතර, දේශපාලන මූලයන් විසින් අඛණ්ඩ අසමානතා පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩ වර්ජන හා විරෝධතා සංවිධානය කරනු ලබයි.

කාන්තා දිනය පැවැත්වෙන්නේ මාර්තු 08 වන දාය. ජාත්‍යන්තර කාන්තා දිනයක් සම්බන්ධයෙන් ක්ලාරා කළ යෝජනාවේ නිශ්චිත දිනයක් සඳහන් නොවිය. 1917 දී රුසියානු කාන්තාවන් "පාන් සහ සාමය" ඉල්ලා සිටි යුද්ධ කාලීන වැඩ වර්ජනයක් තෙක් එය විධිමත් නොකෙරිණ. කාන්තා වැඩ වර්ජනයට දින හතරක් ගත වන විට සාර්ට ඉවත් වීමට බල කෙරුණු අතර තාවකාලික රජය කාන්තාවන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දුන්නේය. එම වැඩවර්ජනය පැවති දිනය එකල රුසියාවේ භාවිත වූ ජූලියන් දින දර්ශනයට අනුව පෙබරවාරි 23 වන දා විය. ග්‍රෙගරියන් දින දර්ශනයට අනුව එම දිනය මාර්තු 08 ලෙස සටහන් වේ.

රුසියාව ඇතුළු රටවල් රැසක ජාත්‍යන්තර කාන්තා දිනය ජාතික නිවාඩු දිනයක් ලෙස නම් කර තිබේ. මාර්තු 08 දිනය ආසන්න වෙද්දී එම රටවල මල් අලෙවිය දෙගුණයකින් පමණ ඉහළ යයි. චීනයේ මාර්තු 08 වන දා බොහෝ කාන්තාවන්ට දින භාගයක නිවාඩු හිමිවෙයි. එරට රාජ්‍ය කවුන්සිලය එලෙස උපදෙස් දී තිබුණ ද, බොහෝ හාම්පුතුන් එම නිවාඩුව ලබා නොදේ. ඉතාලියේ ජාත්‍යන්තර කාන්තා දිනය සමරන්නේ, මිමෝසා මල් ප්‍රදානය කිරීමෙනි. මෙම සම්ප්‍රදායේ ආරම්භය කෙසේ සිදුවී ද යන්න පැහැදිලි නැත. එහෙත්, එය දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු රෝමයෙන් ඇරඹුණු බව විශ්වාස කෙරේ.

ඇමෙරිකාවේ මාර්තු මාසය සැලකෙන්නේ, කාන්තාවන්ගේ ඉතිහාස මාසය ලෙසය. ඇමෙරිකාවේ කාන්තාවන් ලැබූ ජයග්‍රහණ සම්බන්ධයෙන් ගෞරව දැක්වීම සඳහා ජනාධිපතිවරයා වාර්ෂික නිවේදනයක්ද නිකුත් කරයි.

"ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා නවෝත්පාදන සහ තාක්ෂණය" යන තේමාව යටතේ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම, 2023 මාර්තු 8 බදාදා සිදු කෙරේ. ලෝකයේ බොහෝ රටවල් මෙය ඉහළින් සමරණු ලැබේ. මේ සඳහා තාක්ෂණවේදීන්, නවෝත්පාදකයින්, ව්‍යවසායකයින් සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතා ක්‍රියාකාරීන් සම්බන්ධ කර ඩිජිටල් මෙවලම් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීමේදී සියලුම පාර්ශ්වකරුවන්ගේ කාර්යභාරය ඉස්මතු කිරීමට අවස්ථාවක් ලබා දේ.



අමිල දර්ශන හේරත්

# නැවත කොවිඩ් වැනි හදිසි අවස්ථාවක් ඇතිවුවහොත් ආයතනයේ පැවැත්ම වෙනුවෙන්

# රු. මිලියන 300 ක තැන්පතුවක්...

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 1979 වර්ෂයේ අංක 17 පදරන පනත යටතේ ක්‍රියාත්මක ආයතනයක්. නිවාස විෂයභාර අමාත්‍යතුමන් විසින් පත් කරනු ලබන සභාපති-වරයකු හා අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් අධිකාරිය පාලනය කිරීම සිදු කරනු ලබනවා. ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙස සාමාන්‍යාධිකාරී ක්‍රියා කෙරෙන අතර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරු යටතේ මෙහෙයවනු ලබන අංශ 8ක් මඟින් කළමනාකරණ කමිටුවේ තීරණ ක්‍රියාත්මක කරනු ලබනවා. ආයතනයෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා එහි සියලු මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ වගකීම මෙම සියලු අංශ සතුයි.

## "ආයතනයේ වත්මන් සේවක සංඛ්‍යාව 1800ක්"

කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රධාන කාර්යාලය මඟින් හා දිවයින පුරා ව්‍යාප්ත වූ ප්‍රාදේශීය කාර්යාල 25කින් සහ නාගර කාර්යාල 02කින් යුතු ශාඛා ජාලයක් මඟින් ආයතනයේ සියලු කාර්යයන් ක්‍රියාත්මක කරනවා. වර්තමානයේ 1,800 කට ආසන්න සේවක පිරිසකගෙන් යුතු කාර්ය මණ්ඩලයක් මෙහි සේවය කරනවා.
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යනු දිවයින පුරා නිවාස ගැටළුවලට මුහුණදී ඇති ජන කොට්ඨාශයට උපකාර කිරීමේ ඒකායන අරමුණ පෙරදැරි කරගෙන ඒ සඳහා විශේෂ අවධානය යොමු කර ඇති ආයතනයක්. ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම මූලික පහසුකම් සහිත සුරක්ෂිත නිවසක් හිමිකර දීම අපගේ අරමුණයි.
වර්තමානය වනවිට ආයතනය අභියෝග රැසකට මුහුණ දී තිබෙනවා. රට මුහුණ දුන් කොවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදය සමඟ ආයතනය පවත්වාගෙන යාමත් විශාල අභියෝගයක්. නමුත් අපි මේ වනවිට ඒ අභියෝගය ජයගෙන තිබෙනවා.

## "සියලුම සේවකයින්ට රු. 5000ක දීමනාවක් දෙන්න පියවර ගත්තා"

මෙවර අයවැයෙන් මේ වසරේ සංවර්ධන වැඩසටහන් වලට විශාල මුදලක් වෙන් වෙලා නැහැ. අයවැයෙන් අපිට ඉලක්ක ප්‍රමාණයක් ලබා දී තිබෙනවා. සංවර්ධන වැ-ඩසටහන් වලට සල්ලි එන්නේ කොහොමද යන්න අපි මුහුණ දීලා තියෙන විශාල අභියෝගයක්. නිවාස 98,000 ක් තිබෙනවා. එම නිවාස විවිධ ඉදිකිරීම් මට්ටමින් තිබෙන ඒවා. සමහර නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් ලක්ෂ 5 නිවාස ණය වාරික ලබා දී ඇත්තේද කොටස් ලෙසයි. මේ නිවාස සියල්ලගේම වැඩ නිම කරන්න මිලියන 24,000 පමණ මුදලක් අවශ්‍ය වනවා. එවැනි මුදලක් කවදද අපිට හම්බවෙන්නේ. රජයේ තිබෙන මුදල් තත්ත්වය බැලුවිත් තේරුම් ගත යුතුයි. එහෙම නොවුණොත් අපි අසාධ වෙනවා.
දිස්ත්‍රික් කළමනාකරුවන් තමයි ආයතනයේ කොඳු නාරටිය වන්නේ. ආයතනයේ ඉහළ කළමණාකාරිත්වයේ සිටින අපි කොළඹ ඉඳන් සැලසුම් හැදුවත් උපදෙස් දුන්නත් දිස්ත්‍රික් කළමණාකරුවන් හරියට දිස්ත්‍රික්කය තුළ වැඩපිළිවෙල ක්‍රියාත්මක කළේ නැත්නම් ආයතනයට සාර්ථක වෙන්න බැහැ.

## "රජයේ මුදල් තත්වය තේරුම් ගෙන අප කටයුතු කල යුතුයි"

පසුගිය වසරේ මාර්තු මාසයේදී ණය වාරික අයකර ගැනීමෙන් රුපියල් මිලියන 308 ක් අපිට හිමි වුණා. නමුත් පසුව අරගලය, දේශපාලන හා ආර්ථික අර්බුද සියල්ල නිසා ප්‍රති අයෝජ්‍ය වන විට රුපියල් මිලියන 150ට වැටුණා. මම මේ ආයතනයේ සභාපතිවරයා ලෙස වැඩ භාර ගෙන වැඩි කාලයක් වන්නේ නෑ. නමුත් මා පැමිණි පසු පියවර කිහිපයක් ගත්තා. ඒ අනුව තමයි මීට කලින් අපි මහනුවරදී දිස්ත්‍රික් කළමණාකරුවන් මුණ ගැසුණේ. ඒ සාකච්ඡාවෙන් පසුව මාස 2 ක් තුළ අපිට මිලියන 300 සීමාවට එන්න හැකි වුණා. පසුව මාස 3ක්ම අපි මිලියන 300 ඉක්මවා ගිය මුදලක් එකතු කළා. ගිය මාසයේ මිලියන 276 ට අඩු වුණා. මෙම කාර්යය සාර්ථක කර ගන්න සියලුම දිස්ත්‍රික් කළමණාකරුවන් විශාල කැප කිරීමක් සිදු කළා.



**රජීව් සූරියආරච්චි**
සභාපති
නිවාස සංවර්ධන අධිකාරිය

## "ආයතනයේ සියලු සේවකයින් රැක ගැනීම අපේ වගකීමයි"

අපේ ආයතනයේ වත්මන් සේවක ගණන 1,800 ක් පමණ වනවා. කොයි ආණ්ඩුවෙන් කවුරු පත් කළත් මේ සියලු සේවකයින් අපේ ආයතනයේ අයයි. මේ සේවකයින් මොන පක්ෂයේද කියලා මං සොයා බලන්නේ නැහැ. අපේ සේවකයින් අද දුක් මහන්සි වෙලා තමයි මේ වැඩ ටික කරන්නේ. ඔවුන්ට අපි අත්වැලක් විය යුතුයි. ඔවුන් නිසි ලෙස රැකබලා නොගත්තොත් ඔවුන්ට ආදරය නොකළොත් අපේ ආයතනයේ වැඩසටහන ඉදිරියට කරගෙන යන්න බැහැ.
මම සභාපති ලෙස පත් වූ ගමන් වෘත්තීය සමිති මගෙන් ඉල්ලීමක් කළා රාජ්‍ය අංශයට වැඩි කළ රුපියල් 2,500 වැඩි කරලා දෙන්න කියලා. නමුත් අපි ඉන් එහාට ගිහින් දෙසැම්බර් මාසයේ සිට රුපියල් 5,000 ක දීමනාවක් වශයෙන් දෙන්න පියවර ගත්තා. රටේ තත්ත්වය මත මේ රු 5,000 දීමනාව දෙන්න විරුද්ධ වෙන්න එපා යැයි මා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගෙන් ඉල්ලීමක් කළා. පසුව ඇමතිතුමා අමාත්‍යාංශ ලේකම්ව ගෙන්වා සාකච්ඡා කරලා රු 5,000 දීමනාව වහන්ම ආයතනයේ උපයේවීම් ලබා දෙන්නත් අනුමැතිය ලබා දුන්නා. මෙම දීමනාව ලබා දෙන්න අපිට ලක්ෂ 90 ක් වැය වෙනවා.

නැවත කොවිඩ් එන්න පුළුවන්, නැවත අරගල එන්න පුළුවන්. ආයෙත් මේ රට වැහෙන්න පුළුවන්. මේ සියල්ල අනාගතයේ තිබෙන අවදානම්. එවැනි දවසක නැවත රට වහන්න කරනකොට ආයතනයේ සේවකයෝ අපි රැක ගත යුතුයි. අඩුම තරමින් මාස 06කටවත් ආයතනයේ සේවකයින්ගේ පඩි ගෙවන්න ඉතිරි කර ගත් මුදලක් තියෙන්න ඕනි. එය ආයතනයේ කළමනාකාරිත්-වයේ වගකීම. අපි ගෙදර යන දවසට ජාතික නිවාස සංවර්ධන අධිකාරියත් වහන්න වුණොත් ඒක විශාල ප්‍රශ්නයක්. ඉන් එහාට ගිය දැක්මක් එක්ක තමයි අපි දැන් වැඩ කරන්නේ.
අපි රුපියල් මිලියන 300 සීමාවට මුදල් එකතු කරන්න ගන්නට පස්සේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල්ට උපදෙස් දුන්නා සෑම මාසෙකම රුපියල් මිලියන 50 ක මුදලක් අරමුදලක් ලෙස එකතු කරන්නට. මේ වනවිට රු මිලියන 300 ක මුදලක් භාණ්ඩාගාර අරමුදල්වල තැන්පත් කර තිබෙනවා. ඒකට මාසෙකට රු ලක්ෂ 25 පමණ පොලියකුත් ලැබෙනවා ඇති කියලා මා විශ්වාස කරනවා.

## "දිස්ත්‍රික් කළමණාකරුවන් ආයතනයේ කොඳුනාරටියයි. ඔවුන් හරියට වැඩ පිළිවෙල ක්‍රියාත්මක කළේ නැත්නම් ආයතනයට සාර්ථක වෙන්න බෑ"

රටේ තියෙන ප්‍රශ්න පැය 24 කින් විසඳනවා කියන මානසිකත්වයෙන් ඉන්න එපා. මේ රට යම් තැනකට එන්න අවුරුද්දක් දෙකක් යයි. ඒ අවුරුදු දෙක තුනක කාලය අපි අපේ තැන හදා ගන්න ඕනි කොහොමද? රජයෙන් අපිට සල්ලි දෙන්නේ නෑ. කොහොමද එතකොට අපි අපේ සැලසුම් ක්‍රියාත්මක කරන්නේ. ඒ සැලසුම තමයි අපි මේ දැන් ක්‍රියාත්මක කර තිබෙන්නේ. රු මිලියන 300 සීමාව ඉක්මවා යාමයි අපේ ඉලක්කය වන්නේ. එහෙම නොවුණොත් ආයතනයක් ලෙස අපි අනාතුරක වැටෙනවා. ඒ එක්කම අපි සේවකයන්ගේ සුබ සාධනයක් කරන්නේ කොහොමද කියලා බලමු. රට කොච්චර වැටුනත් අපි අපේ ඉන්න සියළුම සේවකයෝ රැකගෙන ආයතනය රැක ගැනීමේ වගකීම මම භාර ගන්නවා. එයට සහයෝගය මම උප සභාපතිතුමාගෙන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබා ගන්නවා. එය අපිට කරන්න පුළුවන්. එයට හොඳ කණ්ඩායමක් මට ඉන්නවා.

## "සෑම මාසයකම ණය අය කිරීම් වලින් රු. මිලියන 300 සීමාව ඉක්මවා යාම අපේ ඉලක්කයය"

අමිල දර්ශන හේරත්

# කොන්ත්‍රාත්කරුවන්ගේ ගැටලු විසඳීමට නව ක්‍රමවේදයක්

නාලක දහනායක

ශ්‍රී ලාංකීය ඉදිකිරීම් කර්මාන්තය රටේ ආර්ථිකය සඳහා ප්‍රධාන දායකත්වය සපයයි. නමුත් පසුගිය සමයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වසරේ සිට මෙම කර්මාන්තයට විශාල බලපෑමක් ඇති වී තිබේ. පසුගිය කාලය තුළ රට මුහුණ දුන් ආර්ථික තත්ත්වය මත සිය ව්‍යාපෘති අවසන් කර ගැනීමට නොහැකිව කුඩා හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ට ගැටළු රැසකට මුහුණ දීමට සිදුව තිබේ.

විශේෂයෙන්ම කුඩා සහ මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කර්මාන්තය තුළින් රටේ ආර්ථික වර්ධනයට විශාල දායකත්වයක් ලබා දී තිබේ. නමුත් වර්තමානය වන විට 4,000 ක් පමණ වූ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ප්‍රමාණය 2,000 පමණ දක්වා අඩු වී ඇත. මෙම තත්ත්වය වර්තමානයේ ඉදිකිරීම් කර්මාන්තය කඩා වැටීමට ප්‍රධාන හේතුවක් වී තිබේ.

ඒ අනුව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය යටතේ ඇති ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) විසින් කුඩා හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන් සඳහා ඉදිකිරීම් ආරවුල් විසඳීමේ උපදේශන වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත. එහි සමාරම්භක උත්සවය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ ලේකම් ඩබ්ලිව්.එස්. සත්‍යානන්ද මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා කොළඹ 07, සවිසිරිපායේදී පැවැත්විණි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි මෙම වැඩසටහන ක්‍රියාවට නැංවේ. දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන් මුහුණ පා ඇති ගැටළුවලට සහනයක් ලබා දීම මෙහි අරමුණයි. ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියාමකයා ලෙස, 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ කොන්ත්‍රාත්කරුවන්ගේ ගැටළු විසඳීම සම්බන්ධයෙන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මේ වන විට කටයුතු කරනු ලබයි.

මෙහි ප්‍රධාන දේශනය සිදු කළේ සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලයේ සභාපති ඉංජිනේරු රංජිත් දිසානායක මහතා විසිනි.

කුඩා සහ මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ගේ ඉදිකිරීම් ආරවුල් විසඳීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සිය ආයතනය සතු නීතිඥවරුන් සම්බන්ධ කර ගනිමින් මෙම උපදේශන වැඩසටහන නොමිලේ පවත්වනු ලබයි. මෙම වැඩසටහන ඉදිරියේදී දිවයිනේ අනෙකුත් දිස්ත්‍රික්කවලද ක්‍රියාත්මක කිරීමට නියමිතය.



ඡායාරූප - නුවන් දිනේන්ද්‍ර

# බැද්දගාන තෙත් බිම් උද්‍යානයට QR කේතයක්



නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ඇති තෙත් බිම් උද්‍යාන නවීන තාක්ෂණය ඔස්සේ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් බැද්දගාන තෙත් බිම් උද්‍යානය සඳහා නව QR කේතයක් හඳුන්වා දීම නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති නිමේෂ් හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදු කෙරිණි.

මෙය ක්‍රියාත්මක කෙරුණේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි පෙබරවාරි මස 02 වැනිදාට යෙදුනු ලෝක තෙත් බිම් දිනයට සමගාමීවයි. මෙම උද්‍යාන සංචාරක ආකර්ෂණීය කලාප ලෙස සංවර්ධනය කිරීම මෙහි අරමුණයි.

ලෝක තෙත්බිම් දිනයට නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශය විසින් සංවිධානය කරන ලද වැඩසටහන් කිහිපයක් බැද්දගාන තෙත් බිම් උද්‍යානය සහ කෝට්ටේ, කොටුබැම්ම තෙත් බිම් උද්‍යානය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්විණි.

බස්නාහිර පළාතේ බාලදක්ෂිකාවන් 150 කගේ සහභාගීත්වයෙන් නිරීක්ෂණ හා අධ්‍යයන වැඩසටහනක් සහ නාගරික සංවර්ධන අධිකාරියේ පර්යේෂණ අංශයේ පාරිසරික ශිල්පීන්, භූ දර්ශන ශිල්පීන් ඇතුළු නිලධාරීන් සඳහා තෙත් බිම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ද මෙහිදී සිදු කෙරිණි.

සෑම වසරකම පෙබරවාරි මස 02 වනදා ලෝක තෙත් බිම් දිනය ලෙස තෙත්බිම් පිළිබඳ රැම්සාර් සම්මුතිය විසින් නම් කර තිබේ. මෙවර ලෝක තෙත් බිම් දිනයේ තේමාව ලෙස නම් කර ඇත්තේ "කාලය එළඹ ඇත" යන්නයි. රැම්සාර් සම්මුතිය යනු 1971 වසරේ පෙබරවාරි 02 වනදා ඉරානයේ රැම්සාර් නගරයේදී සම්මත කරන ලද අන්තර්ජාතික ගිවිසුමකි. 1990 වසරේ සිට ශ්‍රී ලංකාවද එහි පාර්ශවකරුවෙකු වේ.

නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (උපදේශක) ආනන්ද සමරසිංහ, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් - කලාප 02) ලලිත් විජයරත්න, අධ්‍යක්ෂ (පරිසර හා භූ දර්ශන) චන්ද්‍රනා කලුපහන, ප්‍රධාන බාලදක්ෂිකා කොමසාරිස් සුලාරි විජේවර්ධන යන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් මේ සඳහා සහභාගී වූහ.

ඡායාරූප - සරත් ජයතිලක

නිහාර චාමික පෙරේරා

# 75 වන නිදහස් සැමරුම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් දිවයින පුරා සංවිධානය කළ රුක් රෝපණ වැඩසටහන



75 වන නිදහස් සැමරුම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවිධානය කළ රුක් රෝපණ වැඩසටහනක් ඊයේ (04) දින දිවයින පුරා ක්‍රියාත්මක කෙරුණි.

නිදහස් සැමරුම් දිනයට සමගාමීව නාගරික වනපෙත් හැත්තෑපහක් සකස් කිරීමට නියමිත බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පසුගියදා පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශ කළේය.

ඒ අනුව නාගරික වනපෙත් යටතට නාගරික වන උයන් මෙන්ම මංමාවත් දෙපස ඇති ගසකොළ, උද්‍යාන, ගංගා හා වෙරළබඩ මංතීරු, තෙත්බිම්, සංරක්ෂිත වනපෙත් කේන්ද්‍ර කර ගනිමින් මෙම පැළ සිටුවීම සිදු කරන ලදී. නාගරික වනපෙත් 75 ක් ඉදිකිරීමේ වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැලයක් රෝපණය කරන අයුරුය ඡායාරූපයේ දැක්වේ.

අමිල දර්ශන හේරත්

# வடக்கில் சிறுநீரக நோயைக் கட்டுப்படுத்தி குடிநீர் பிரச்சினையைத் தீர்க்க நனோ நீர் சுத்திகரிப்பு தொழிற்சாலைகள்

நம் நாட்டில் தொற்று நோய்களை விட தொற்றா நோய்கள் மிகவும் ஆபத்தான அளவில் அதிகரித்து வருகின்றன. தனி நபர் இறப்பு விகிதம் அதிகரிப்பதற்கு இந்த தொற்றா நோய்கள் முக்கிய காரணமாகக் காட்டப்படுகிறது. அவற்றுள் சிறுநீரக நோய் முதன்மையானது. சிறுநீரக நோயால் பாதிக்கப்படுபவர்களின் எண்ணிக்கை நாளுக்கு நாள் அதிகரித்து வருகிறது.

வடமத்திய, வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் சிறுநீரக நோயாளர்களின் எண்ணிக்கை மிகவும் அதிகமாக உள்ளது. இது தொடர்புடைய அறிஞர்களின் கூற்றுப்படி, நாட்டின் வடமத்திய மாகாணத்தில் சிறுநீரக நோய் (ஊமுனுரு) பரவுவதற்கான காரணம் நீரில் உள்ள புளோரைடு, காட்மியம் மற்றும் கடினத்தன்மை ஆகும்.

இதுவரை நீரில் கலந்துள்ள ஆர்சனிக், காட்மியம், அலுமினியம் போன்ற பார உலோகங்களின் அதிக செறிவுகளே கண்டறியப்படாத சிறுநீரக நோய்க்குக் காரணம் என ஊகிக்கப்பட்டது. இரசாயன உரங்களில் உள்ள காட்மியம் மட்டுமே இதற்குக் காரணம் என்ற மக்கள் கருத்து இத்துடன் நிராகரிக்கப்பட வேண்டும்.

நாடளாவிய ரீதியில் பரவிவரும் சிறுநீரக நோய்க்கு முற்றுப்புள்ளி வைக்க சுத்திகரிக்கப்பட்ட நீர் பெரும் உதவியாக உள்ளது.

நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சர் பிரசன்ன ரணதுங்கவின் பணிப்புரையின் பிரகாரம் வடமாகாணத்தில் சிறுநீரக நோயைக் கட்டுப்படுத்தவும் அப்பகுதி மக்களின் குடிநீர்ப் பிரச்சினையைத் தீர்க்கவும் 50 நானோ நீர் சுத்திகரிப்பு நிலையங்களை நிறுவும் திட்டம் அந்த அமைச்சின் கீழ் உள்ள மீள்குடியேற்றப் பிரிவு பொது மக்கள் நீர் திணைக்களத்தின் ஒத்துழைப்புடன் செயற்படுத்தப்படுத்தப்படுகின்றது. இதற்காக தனியார் துறையினரும் ஈடுபடுத்தப்பட்டுள்ளனர்.

இதன்படி, முல்லைத்தீவு மாவட்டத்தில் 4 நானோ நீர் சுத்திகரிப்பு நிலையங்களும், கிளிநொச்சி மற்றும் வவுனியா மாவட்டங்களில் தலா 23 நானோ நீர் சுத்திகரிப்பு நிலையங்களும் நிறுவப்படவுள்ளன.

நீர் சுத்திகரிப்புக்கான நனோ தொழில்நுட்ப நீர் சுத்திகரிப்பு அமைப்பான நனோ வடிகட்டுதலை (யேழெ குடைவசயவழைெ) து -யபரய பயன்படுத்துகின்றது. நனோ வடிகட்டுதல் (கே) என்பது சவ்வு அடிப்படையிலான நீர் சுத்திகரிப்பு அமைப்பு ஆகும். இது அதிக உப்புகள் அல்லது இரட்டை வலுவுள்ள மூலகங்களை நீக்குகிறது. ஆனால் சோடியம் குளோரைடு போன்ற ஒற்றை வலுவளவு உப்புகள் அதன் வழியாக செல்ல முடிகின்றது. முக்கியமாக கைத்தொழில் ரீதியாக இந்த கே சவ்வு நீரின் கடினத் தன்மையைக் குறைக்க பயன்படுத்தப்படுகின்றது. நீரில் கரைந்த உப்பு உள்ளடக்கம் (வுனுளு)) 1500 ீஅ குறைவாக இருக்கும் எந்த நீர் மூலத்திற்கு என் எ்.ப் சிகிச்சை முறை மிகவும் பொருத்தமானது. மேலும், நனோ சுத்திகரிப்பு மூலம் நச்சுகள், பார உலோகங்கள் மற்றும் ஏனைய சேதன இரசாயன உலோகங்கள் அகற்றப்பட்டு நீரின் சுவையும் துர்நாற்றமும் நீக்கப்படும். இந்த நனோ நீர் சுத்திகரிப்பு நிலையம் நாளொன்றுக்கு சுமார் 2000 லீற்றர் நீரை சுத்திகரிக்கும் திறன் கொண்டது என்றும் மீள்குடியேற்ற பிரிவு கூறுகிறது.

2021 இல் ஆரம்பிக்கப்பட்ட இத்திட்டத்தின் மொத்த பெறுமதி 209 மில்லியன் ரூபாவாகும். இந்தத் திட்டத்தின் சுமார் 60 வீத கட்டுமானப் பணிகள் நிறைவடைந்துள்ளதாக நகர அபிவிருத்தி அமைச்சின் கீழ் இயங்கும் மீள்குடியேற்றப் பிரிவு தெரிவித்துள்ளது.

ஆதிகாலத்தில் இங்கு பயன்படுத்தப்பட்ட சூழலோடு இணைந்த விவசாயத்தை முழுமையாக நிறுத்தி நாம் இரசாயன உரங்களைப் பயன்படுத்த ஆரம்பித்த பின்னர் சூழலுக்கும் மனித உயிர்களுக்கும் பல இழப்புக்கள் ஏற்பட்டன. சிறுநீரக நோய், புற்றுநோய் போன்ற நோய்கள் இந்நாட்டில் பரவ இது ஒரு காரணமாக அமைந்தது. அதனால்தான் முன்னாள் ஜனாதிபதி கோட்டாபய ராஜபக்ஷ இரசாயன உரங்களை தடை செய்ய நடவடிக்கை எடுத்தார். அந்த முடிவை நடைமுறைப்படுத்தும் போது சமூகத்தில் பல்வேறு பிரச்சினைகள் ஏற்பட்டாலும் முன்னாள் ஜனாதிபதியின் தீர்மானம் நல்ல நோக்கத்துடன் எடுக்கப்பட்ட தீர்மானம் என்பது தெளிவாகின்றது. இருப்பினும், உலகின் பல நாடுகள் ரசாயன உரங்களை பயன்படுத்துவதில் இருந்து படிப்படியாக விலகி வருகின்றன.





முனீரா அபூபக்கர்

# හද ඇඳි රේඛා

මුළු නිවසම එළිය කෙරූ මගේ දූ
කාලය ගෙවී දින සති අවුරුදු
සිරියාවයි මුළු ගෙදරම මගෙන් දූ
පිපුණු මල්වලට බඹරු වසයි මගේ දූ

මල හතක් පළඳා කුළු ගෙදරට පියමැන්නේ
සතුටු කඳුළු බිඳෙන් මං දුටුම නෙත් වන්නේ
අඹත් නමත් දුව නුඹ හට අද ලැබුණේ
බිරිඳකි අද දිනසිට ඔබ මතු නොවනේ

වදන් පවන් මං දුව මනාලිම දරන්නේ
අම්මා කෙනෙකි නුඹ අද යළි උපන්නේ
ලොවේ ජීවය ඇයයි කියනා කතාවේ
දැනෙනයි සතුතක් වී මට දූ නිසාවෙන්

හිමාරා රශ්මි බණ්ඩාර

ජීවනා පෙරදී කළමුත් මුව හඹ බ රිස
දනසතියකුගෙ බැදුමෙරන් මහ මඟට බැස
සැනසෙන ලෙසක් නැතිමයන් උණු කඳුළු පිස
මොනවා කරන්න ද අබිසරුවන බ බිස

කුස්සියට වැද වියමන් නිමාකොට
ඇමදු ගේ දොර පිස දමා පිළිවෙලට
සෝදලා කිලි කුණුත්
නාවලා සුරතලුන්
පිරිසිදුව හිනැහුනා ඈ...
මහන්සිය පසෙක විසිකොට
උරුම වූ දුක් සයුර
කරුමයක් නොකර ගෙනම
සිරුවට කරන ගෙත්තම
ජීවිතය ජය ගන්න
වචනයෙන් කෙලෙසද්දෝ
පවසන්නේ කවුරුදෝ
පෙගුණු සීතල හදවතේ
හිමිකාරි ඈ
හමුවුණාද ඔබටත්
අතරමගදී හෝ ජීවිතේ

පූජනී අප්සරා



කේඩෑරි වී ගිය පොළවට
හිමිදිරියේ වට වැස්ස ඔබය...
ප්‍රථම ප්‍රේමයෙන්
මිදිය නොහැකිව
පීඩා විඳි හිතට
සැනසුම ගෙන ආවේ ඔබය...
අමාවක රැය
රහසේ පායා දිලී සැඟව ගිය
තාරුකාව ද ඔබමය

අපෙ අම්මා දුර බිනුම් පෙනෙන්නා
පෙනන්ගානක මල් පිපිලා මැනෙන්නා
මලේ රුවට බඹ සායිනි තිබෙන්නා
අම්මා නැති අරුමේ දැන් මට දැනෙන්නා

පිටතදී මවක් ලෙස කිරි වරෙතා
සහෝදරියක්ව සෙනෙහස පුදනා
දියණියක් වී තම යුතුකම ඉටුකරනා
කහත් වෙවී මහ සයුරත් කොයත්සිදෙනා

மங்கையாய் பிறக்க நல்ல
மாதவம் செய்ய வேண்டும்
தங்கையாய் வாழும் பெண்கள்
தன் கையை நம்ப வேண்டும்
பங்கமாய் போகும்
கெட்ட பரம்பரை எமக்கு வேண்டாம்
சங்கையாய் வாழும் நல்ல
சங்கதி படிக்க வேண்டும்
கண்களை உறுத்தும் தூசு
கண்ணீரை வரவழைக்கும்
பெண்களை உறுத்தும் ஆண்கள்
பேதமை நீங்க வேண்டும்
பெண்களே உலகின் கண்கள்
பெரியவர் சொல்லக் கேட்டோம்
விண்ணகம் அதிர எங்கள்
விஞ்ஞான ஆய்வு வேண்டும்
முக்கனி என்று பேசும்
மூதவர் சொல்லில் நாங்கள்
சக்கைகள் இல்லாமலே
சரித்திரம் படைக்க வேண்டும்
சொக்கிடும் பெண்கள் புகழ்
சோ வெனப் பரவும் நாளை
அக்கமாய் காண நாங்கள்
அணி திரள்வோமே வாரீர்.

පිං කළ යුතුය
ගැහැණියක් වී ඉපදීමට
ගැහැණියක්ව සිටින කාන්තාව
ස්වෝත්සාහයෙන් නැගී සිටිය යුතුය
වැරදි මග යන පරම්පරාවක් අපට අවශ්‍ය නැත
හොඳින් ජීවිතයට හොඳින් දේ උගත යුතුය
දුවිලි ඇසට කඳුලු ගෙනෙනවා සේ
කාන්තාවට දුක් දෙන
පිරිමින්ගේ කරදර තුරන් විය යුතුය
කාන්තාව ලෝකයට එලිය දෙයි යනුවෙන්
වැඩිහිටියන් පවසනු අසා ඇත්තෙමු
ඔබ අහස සිසාරා අධ්‍යයනයේ යෙදිය යුතුය
අසහාය තුරන් වූ
ඉතිහාසයක් ගොඩනගමු
කාන්තාවගේ කීර්තිය බැබළෙන දවස
දැකීමට පෙලගැසෙමු

මුනීරා අබු බක්කර්

# සුහද ක්‍රිකට් තරගාවලිය 2022



නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවිධානය කළ සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය නාරාහේන්පිට සාලිකා ක්‍රීඩාංගණයේදී පසුගියදා පැවැත්විණි. මෙම තරගාවලිය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ පළාත් කාර්යාල සහ අධිකාරියේ විවිධ අංශ නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ විශාල පිරිසක් සහභාගී වූහ.

ඡායාරූප - නුවන් දිනේන්ද්‍ර
නලින් හේවාපතිරණ